**#mediaethicsSL #SinhalaPress #lka #Divaina #August09**

පසුගිය සතියේ දිනක පළවූ දිවයින පුවත්පතේ කතුවැකිය මගින් බාලවයස්කරුවන් ලිංගිකව අපයෝජනය කිරීම සහ ඒ පිළිබඳව ඇති නීති රීති කෙතරම් ප්‍රමාණවත් වේ ද යන්න සම්බන්ධයෙන් ප්‍රබල අදහස් කිහිපයක් ඉදිරිපත් කොට තිබිණි.

බාලවයස්කරුවන් ලිංගික අපයෝජනයන්ට ලක්වීම මේ වන විට ශ්‍රී ලංකාවේ බරපතලම සමාජ උවදුරක් බවට පත්ව තිබෙනා බව නොරහසකි. ඒ සඳහා දැනට ලබාදෙන දඬුවම් ප්‍රමාණවත් වේ ද යන්නත්, සැබෑ වරද කරුවන් හට රිංගා යා හැකි පරිදි නීතියේ හිල් තිබේද යන්නත් පිළිබඳව ප්‍රබල කතිකාවතක් ඇතිවිය යුතු අතර, එම තත්වයන් වෙනස් කිරීම සඳහා විධිවිධාන නොපමා ව ක්‍රියාත්මක විය යුතු බවට අප සැමට එකඟ විය හැක.

කෙසේ නමුත් දිවයින කතු වැකිය මගින් දක්වන ආකාරයට මාධ්‍ය සදාචාරය නිසා සැකකරුවන්ගේ නම් ප්‍රසිද්ධ නොකිරීම වැනි භාවිතයක් වෙනස් විය යුතුද? යම් හෙයකින් සැකකරු සැබැවින්ම නිවැරදිකරුවෙකු නම්, දිවයින කතු වැකිය මගින් යෝජනා කරන ආකාරයට එම නම් ප්‍රසිද්ධ කොට උසාවියට යෑමට පෙරාතුවම දඬුවම් ලබාදීම මගින් නිවැරදි කරුවෙකුගේ ජීවිතය විනාශ නොවනු ඇති ද? ඒ පිළිබඳ උදාහරණ අපට මෑත අතීතයෙන්ම ලබාගත හැක.

මෙයට අමතරව දූෂණය යන වදන වෙනුවට ලිංගික අපරාධය හෝ ලිංගික අපයෝජනය යන යෙදුම වඩාත් උචිත වන බවද අපි පෙන්වා දෙමු.

මේ පිළිබඳව පාඨක ඔබේ අදහස කුමක්ද?